# ගෘහ ආර්ථිකය සහ පෝෂණය වැඩි දියුණුකර පවුල් ඒකක සවිබල ගැන්වීමේ
# ජාතික ගෙවතු වගා වැඩසටහන

## වියළි කලාපය

### ආදර්ශ ගෙවතු සංවර්ධනය සඳහා උපදෙස්





ගෙවත්ත සඳහා ආදර්ශ සැලසුමක් (වර්ග මීටර් 1000 සඳහා)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය
ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන

# ...ළ කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | කැරවිල | බණ්ඩක්කා | මෑ | වැටකොළු |
|---|---|---|---|---|
| |  1 |  2 |  3 |  4 |
| බිම සැකසීම | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා සැට පෙළි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාළ පරතරයට සකසා ගත් වළවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දැහැයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් ලෝන් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කුඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ පැළ අතර මීටර් 1 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ පැළ අතර සෙ.මී. 60 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ පැළ අතර සෙ.මී. 30 | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ පැළ අතර මීටර් 1.5 |
| බීජ/පැළ සිටුවීම | එක වළක බීජ 2 ක් සිටුවන්න. | එක වළක බීජ 3-4 ක් දමා පැළවී සති 2 කදී පමණ නිරෝගී පැළ 2 ක් ඉතිරිකර වැඩි පැළ ඉවත් කරන්න. | එක වළක බීජ 2 ක් සිටුවන්න. | එක වළක බීජ 2 ක් සිටුවා සති 2-3 කදී නිරෝගී පැළයක් ඉතිරි කරන්න. කෝප්ප කටුවක හෝ පොලිතීන් බඳුනක පැළකර සති 3ක් පමණ වූ නිරෝගී පැළයක් වළක සිටුවීම වඩාත් සාර්ථකවේ. |
| වගා පාලන කටයුතු | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා පල කුණුවීම වළක්වා ගැනීමට කරල් මලෙන් පසුව විගසම කඩදාසි හෝ පතුල විවෘත පොලිතීන් බෑග් යොදා ආවරණය කරන්න. හානි වූ කරල් එකතු කර බිම තබා හෝ ගැඹුරට වළලා විනාශ කරන්න. | වගාවේ මුල් අවස්ථාවේ වර්ධනය දුර්වල වුවහොත් ශාක වර්ධනය නාවක ඇතිකර ගත හැකියි. මේ නිසා හොඳින් කාබනික පොහොර යොදා, ජල සම්පාදනය කර දිරීමත් පැළයක් ඇති කර ගැනීම හොඳ වගාවක ආරම්භයයි. අස්වනු නෙලන විට වයට පැමිණි ඇති පලද ද ඉවත් කරන්න. | සිටුවා සති 2-3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වලට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමු කිරීමද කළ හැකිය. ලපටි දළු හා කරල් වලට කුඩින්ගෙන් (කළු දුඹුරු පැහැයට හුරු කුඩා සතුන්) සිදුවන හානිය දැකගත් විගස අත ඉවත්කරන්න. ගහණය අධික නම් එම කොටස් කපා ඉවත් කරන්න. | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා පල කුණුවීම වළක්වා ගැනීමට කරල් සෑදුණු විගසම කඩදාසි හෝ පතුල විවෘත පොලිතීන් බෑග් යොදා ආවරණය කරන්න. හානි වූ කරල් එකතු කර බිම තැබීම හෝ ගැඹුරට වැළලීම හෝ කළු පොලිතීන් මල්ලක දමා ගැටගසා අව්වේ තබන්න. |
| අස්වැන්න | මාස 2 1/2 කදී පමණ අස්වැන්න නෙලීම ආරම්භ කළහැකිය. | මාස 1 1/2-2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. | මාස 1 1/2-2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. | මාස 2-2 1/2 කදී පමණ අස්වැන්න නෙලීම ආරම්භ කළහැකිය. |
| පෝෂණ ගුණය | රුධිරයේ සීනි ප්‍රමාණය අඩු කරන රසායනික සංයෝග පවතියි. තද කොළ පැහැති කරවිල වල වැඩි ගුණය පවතිය. විටමින් ඒ හා සී, පොස්පරස් හා දළ තන්තු බහුලයි. | කැල්සියම්, අයඩින් සහ විටමින් සී බහුලව අඩංගුවෙයි. | ප්‍රෝටීන්, කැල්සියම්, පොස්පරස් සහ දළ තන්තු බහුල වේ. | තන්තු බහුල පෙතුමෙන් ජීර්ණය වන අඩංගුවෙයි. |

**ඊළඟ වගාව සඳහා අවශ්‍ය බීජ ඔබේ ගෙවත්තේම නිපදවා ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

# වියළි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| | නිවිති | තම්පලා | පිපිඤ්ඤා |
|---|---|---|---|
| බෝගය සහ බීජ වල ස්වරූපය |  |  |  |
| බිම් සැකසීම | පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා ගන්න. බෝගය අනුව සුදුසු පරතරයට දිග, පළල සහ ගැඹුර සෙ.මී. 30 ක් පමණ වූ වළවල් සකසා ගන්න. |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කුඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී 30<br>පේළිය දිගේ තුනීවට බීජ දමන්න. | පේළි අතර. මීටර් 1<br>පේළිය තුළ. පැළ අතර මීටර් 1 |
| බීජ/පැළ සිටුවීම | එක වලක බීජ 2 ක් සිටුවන්න. | බීජ සෙ.මී 1 ක් පමණ ගැඹුරට දමන්න.<br>බීජ වැලි සමඟ මිශ්‍රකර යෙදීමෙන් තුනීවට බීජ දැමීම පහසු වේ. | එක් වලක එකිනෙකට තරමක් දුරින් බීජ 3-4 බැගින් (සෙ.මී. 2-3 ගැඹුරින්) සිටුවන්න.<br>බීජ පැළවී සති 2 ක් ගතවූ පසු එක් වලක පැළ 2 ක් ඉතිරි කර වැඩි පැළ ඉවත් කරන්න. |
| වගා පාලන කටයුතු | දියකරගත් අමු ගොම පත්‍ර තෙමෙන සේ සති කිහිපයකට වරක් යොදන්න. පොළව මට්ටමේ සිට අඟල් 6-8 ක් වර්ධනය වූ පසු අග්‍රස්ථය කපා දැමීමෙන් පඳුරක් ආකාරයට වර්ධනය කර ගැනීම හෝ සිටුවා සති 3-4 කදී පොලොව මට්ටමේ සිට අඩි 1-1 1/2 උසින් සිටින සේ පාත්තියට ඉහළින් සැකසූ මැස්සකට යැවීම ද කළ හැකිය. | පැළ ගහනය වැඩි වීම නිසා දුර්වල පැළ ඇතිවේ. එවැනි අවස්ථාවක පැළ තුනී කරන්න. | පැළවලට මීටර් 1 1/2 පමණ උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමුකරන්න.<br>යටිකුරු "වී" (Λ) ආකාරයට සකසා ගත් පන්දලමකට ද යැවිය හැකිය. |
| අස්වැන්න | අස්වැන්න වරින් වර නෙළාගත හැකිය. දණ්ඩ සමඟ කරටි කැපීම මඟින් වර්ධක වර්ධනය දිගටම පවත්වා ගත හැකිය. මල් පිපීමට ඉඩහැරීමෙන් වර්ධනය බාලවේ. මල් කිනිති කඩා ඉවත් කරන්න. | සති 4-6 කදී පමණ ගස් සම්පූර්ණයෙන්ම ගලවා ගැනීම හෝ කඳ කපා ගැනීම තුළින් වරින් වර අස්වනු ගැනීම සඳහා වගාව පවත්වා ගත හැකිය. | පළමු අස්වැන්න මාස 2 කදී පමණ ලබාගත හැක. |
| පෝෂණ ගුණය | විටමින් ඒ, යකඩ හා දළ තන්තු බහුල එළවළුවකි. | යකඩ, කැල්සියම් සහ තන්තු බහුල පලා වර්ගයකි. | දළ තන්තු බහුල පහසුවෙන් පිරණය වන එළවළුවකි. |

**නිරෝගී දිවියක් සඳහා දිනකට එළවළු සහ පලතුරු වර්ග 05 ක් ආහාරයට ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

# වියළි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | මිරිස්  8 | මාළුමිරිස්  9 | තක්කාලි  10 | බටු  11 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | මිරිස්, මාළුමිරිස්, තක්කාලි, බටු වැනි බෝග පසුගිය කන්නයේ වගා නොකළ ස්ථානයක් මේ සඳහා වඩාත් සුදුසුය. පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1 අනුපාතයට පුරවනලද කිලෝ ග්‍රෑම් 10 ප්‍රමාණයේ හාල්මළු හෝ පොලිතීන්මළු වලද සිටුවිය හැකිය. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී 60<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 45 | පේළි අතර සෙ.මී. 40<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| බීජ/පැළ සිටුවීම | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. | | දින 14-21 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. |
| වගා පාලන කටයුතු | කොළකොඩවීම වැනි හානි වළක්වා ගැනීම සඳහා නිතර පරීක්ෂා කර හානිය මුල් අවස්ථාවේම හඳුනාගන්න. දින 3-4 කට වරක් ජලය ස්ප්‍රේ කිරීම හෝ පිඩනයක් යටතේ පත්‍ර වලට ඉසින්න. වරින් වර කොහොඹ බීජ නිස්සාරකය හෝ කොහොඹ පත්‍ර, කුරුඳු, සුදුලූනු, ඉඟුරු වැනි පලිබෝධනාශක ගුණ ඇති ශාක සාර ඉසින්න. පිදුරු, ග්ලිරිසිඩියා කොළ වැනි දෑ වලින් වසුනක් යොදන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | | ගස් කඩා වැටීම වැළැක්වීමට හා ගෙඩි පොළොවේ ගෑවී කුණුවීම වළක්වා ගැනීමට සිටුවා සති 3-4 කදී ආධාරක කෝටු සිටුවන්න. ගසේ වර්ධනය අනුව පුරුක් 3-4 කට වරක් ගස ආධාරකයට ලිහිල්ව ගැට ගසන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | ප්‍රධාන කඳේ පහළින් එන අතු ඉවත් කරන්න. කරටි මැලවී තිබේනම් එම කරටිවල හානිවූ ස්ථානය සහිත කොටස සමඟ කරටිය කඩා විනාශ කරන්න. හානි වූ කරල් ද එලෙස විනාශ කරන්න. |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. |
| පෝෂණ ගුණය | කැල්සියම්, විටමින් ඒ හා සී බහුලයි. | කැල්සියම්, විටමින් ඒ හා බී බහුලයි. | ඉදුනු තක්කාලිවල කැල්සියම්, පොස්පරස් සහ විටමින් සී බහුලය පිළිකා නාශක ගුණයෙන් යුතු ලයිකොපින් සංයෝගය බහුලව අඩංගු වේ. | විටමින් බී සහ කෙඳි බහුලයි. |

**එළවළු සහ පලතුරු වැඩිපුර ආහාරයට ගැනීමෙන් පිළිකා ඇතුළු බොහෝ රෝග වැලඳීමේ අවදානම අඩුවේ.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020